# SRI LANKA EXPORT DEVELOPMENT BOARD

# இலங்கை ஏற்றுமதி அபிவிருத்தி சபை

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

EDB SRI LANKA

**මුදල්, ආර්ථික සංවර්ධනය, ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය සහ සංචාරක අමාත්‍යාංශය**

# ඇබෑර්තු

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ පවතින පහත සඳහන් තනතුරු සඳහා සනාථ වූ හැකියාවන් හා වෘත්තීය නිපුණතාවයෙන් හෙබි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## (01) අභ්‍යන්තර විගණක (MM 1-1)

**රැකියා විස්තරය :**

අපනයන සංවර්ධන මණ්ඩලයෙහි අභ්‍යන්තර විගණන කාර්යයන් සිදු කිරීම සඳහා මණ්ඩලයේ සියලුම මූල්‍ය ගනුදෙනු විගණනය කිරීම.විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් සම්බන්ධීකරණය කිරීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද : (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය/වාණිජ්‍යය/මූදල්/ ව්‍යාපාර කළමනාකරණය/ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්.

   සහ

   රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු එම තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් තිබිය යුතුය.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අතරමැදි විභාගය සමත්වීම සහ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප් පරිමාණය** : MM 1-1: රු. 53,175/= – 10 x 1,375 -15 x 1,910 – රු. 95,575/=

**EPF - සේවකයා - 10% ; මණ්ඩලය - 15% සහ ETF - මණ්ඩලය - 3%**

**තෝරා ගැනීමේ ක්‍රමය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත

**වයස් සීමාව** : වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව අදාළ නොවේ.

## (02) අභ්‍යන්තර විගණන නිලධාරී (JM 1-1)

**රැකියා විස්තරය :**

මූල්‍ය සම්බන්ධ සියලුම අභ්‍යන්තර හා බාහිර ගනුදෙනුවලට අදාළව, අපනයන සංවර්ධන මණ්ඩලයෙහි, අභ්‍යන්තර විගණන ඒකකයේ ප්‍රධානියාගේ අධීක්ෂණය යටතේ අභ්‍යන්තර විගණන කාර්යයන් ඉටු කිරීම, මූල්‍ය ගනුදෙනු සහ ආයතනයේ කිසියම් අක්‍රමිකතා සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම අංශ ප්‍රධානියා විසින් පවරන ලද වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද : (පහත 1 හෝ 2)**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිපාලනය / ගණකාධිකරණය / වාණිජ / මූල්‍ය / ව්‍යාපාර කළමනාකරණය / ව්‍යාපාර පිළිබඳ උපාධියක්.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අතරමැදි විභාගය සමත් වීම.

**වැටුප් පරිමාණය** : JM 1-1 : රු. 42,600/= 10 x 755 18 x 1,135 රු. 70,580/=

**EPF - සේවකයා - 10%; මණ්ඩලය - 15% සහ ETF - මණ්ඩලය - 3%**

**තෝරා ගැනීමේ ක්‍රමය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත.

**වයස් සීමාව** : වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව අදාළ නොවේ.

## (03) කැමරා ශිල්පී /වීඩියෝ කාර්මික (MA 2-1)

**රැකියා විස්තරය :**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් හසුරුවන සියලුම වීඩියෝ පටිගත කිරීමේ කාර්යයන් සඳහා වීඩියෝ කැමරාකරු ලෙස ක්‍රියා කිරීම, උපකරණ ආරක්ෂා කිරීම සහ නඩත්තු කිරීම, ඡායාරූප කටයුතු සිදු කිරීම සහ අවශ්‍ය විට ස්ලයිඩ සකස් කිරීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද:**

**වෘත්තීය**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

## (04) මාණ්ඩලික සහකාර (ප්‍රවාහනය) (MA 2-1)

**රැකියා විස්තරය :**

අපනයන සංවර්ධන මණ්ඩලයේ වාහනවලට අදාළ වාහන නඩත්තුව, අලුත්වැඩියාව සහ සේවා සඳහා ගෙවීම් වවුචර සකස් කිරීම, වාහන නඩත්තු කිරීම සහ අපනයන සංවර්ධන මණ්ඩලයේ වාහන අලුත්වැඩියා කිරීම, ඉන්ධන ඇණවුම් නිකුත් කිරීම සහ ඉන්ධන පොම්ප කිරීම අධීක්ෂණය කිරීම, ධාවන සටහන් සමඟ ඉන්ධන බිල්පත් පරීක්ෂා කිරීම, අපනයන සංවර්ධන මණ්ඩලයෙහි සංචිත වාහන සහ පවරා ඇති වාහනවල ඉන්ධන පරිභෝජනය පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යාම, අධීක්ෂණ නිලධාරීන් විසින් පවරා ඇති වෙනත් ඕනෑම කාර්යයකට සහභාගී වීම, වාහන ඇණිය සහ ලොග් පොත් නඩත්තු කිරීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද:**

**වෘත්තීය**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද තනතුරකට අදාළ විෂය ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 වන මට්ටමට නොවැඩි ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම..

**වැටුප් පරිමාණය** : MA 2-1 (3) සහ (4) : රු. 30,310/- 10 x 300 – 7 x 350 – 4 x 495 – 20 x 660 = රු. 50,940/=

EPF - **සේවකයා - 10%; මණ්ඩලය - 15% සහ** ETF - **මණ්ඩලය - 3%**

**තෝරා ගැනීමේ ක්‍රමය** : (3) සහ (4) : ව්‍යුහගතසම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත.

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව අදාළ නොවේ.

## (05) මෝටර් කාර්මික / රියදුරු (PL 3)

**රැකියා විස්තරය :**

උපදෙස් හා අවශ්‍ය පරිදි අපනයන සංවර්ධන මණ්ඩලයෙහි මෝටර් රථවල සුළු අලුත්වැඩියා කිරීම, වාහනවල දෝෂ පරීක්ෂා කිරීමෙන් පසු අපනයන සංවර්ධන මණ්ඩලයෙහි වාහනවල ප්‍රධාන අලුත්වැඩියා කටයුතු නිර්දේශ කිරීම, අවශ්‍ය වූ විට වාහන පැදවීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද:**

**වෘත්තිය**

මෝටර් කාර්මික කාර්යයට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) හතර (04) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ බර වාහන ධාවනය සඳහා වලංගු බලපත්‍රයක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය** : රු. 26,290/= 10 x 270 – 10 x 300 – 10 x 330 – 12 x 350 - රු. 39,490/=

**EPF - සේවකයා - 10% ; මණ්ඩලය - 15% සහ ETF - මණ්ඩලය 3%**

**තෝරා ගැනීමේ ක්‍රමය** : වෘත්තීය තරග විභාගයකින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව අදාළ නොවේ.

## ඉහත තනතුරු සඳහා අදාළ අනෙකුත් සුදුසුකම් :

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
- විශිෂ්ඨ සදාචාරාත්මක ස්වභාවයකින් යුක්ත විය යුතුය.

## අයදුම් කිරීමේ පිළිවෙල :

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අපනයන සංවර්ධන මණ්ඩලයේ 8 වැනි මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ අංශයෙන් හෝ www.srilankabusiness.com වෙබ් අඩවියෙන් ලබාගත් ("Announcements" කාණ්ඩය යටතේ) EDB ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත 2024.12.05 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත දක්වා ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමඟ අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය.

අයදුම්පත් සහිත ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ යොදන ලද තනතුරු නාමය සලකුණු කළ යුතුය.

අවසන් දිනට පසුව ලැබුණු අයදුම්පත්, අදාළ සහතිකවල පිටපත් නොමැතිව සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත්‍රයේ අතිරේක පිටපතක් අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට පෙර සභාපති / ප්‍රධාන විධායක නිලධාරී වෙත එවිය යුතුය.

2020.10.26 දින අංක 2/2020 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ බලය මුදල්, ආර්ථික සංවර්ධනය, ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම් වෙත පැවරී ඇත.

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**
**NDB - EDB කුලුන, අංක 42, නවම් මාවත, කොළඹ 02.**
**දුරකථන : 011-2300700**